# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,413 - 2024 නොවැම්බර් මස 29 වැනි සිකුරාදා - 2024.11.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 2350 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 දෙසැම්බර් මස 20 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 දෙසැම්බර් මස 06 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## සංශෝධනයයි

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ඇමුණුම - 01

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2,412 හා 2024.11.22 දිනැති, *ගැසට් පත්‍රයේ* IV (අ) වැනි කොටසේ පළ කරන ලද බස්නාහිර පළාත් සභා පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා අධ්‍යාපනවේදී උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම-2024 පහත පරිදි සංශෝධනය කරමි.

1. 3 ඡේදයේ 3.1 අධ්‍යාපන සුදුසුකම් කොටසෙහි iii යටතේ ඇති 5 වන වගන්තිය පහත පරිදි සංශෝධනය විය යුතු ය.

 * ඔබ ඉල්ලුම් කරන විෂයය ඔබ හදාරා ඇති අධ්‍යාපනවේදී උපාධිය තුළ හදාරා ඇති බවට විශ්වවිද්‍යාලය මඟින් තහවුරු කෙරෙන ලිපියක් හා ඔබ ගුරු පුහුණුව හදාරා ඇති බවට සනාථ කෙරෙන ලිපියක් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

2. උපලේඛනය 02 පහත පරිදි සංශෝධනය විය යුතු ය.

*සටහන* : මෙහි සඳහන් සංශෝධනයන්ට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2,412 හා 2024.11.22 දිනැති, *ගැසට් පත්‍රයේ* IV (අ) වැනි කොටසේ පළ කරන ලද "**බස්නාහිර පළාත් සභා පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා අධ්‍යාපනවේදී උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2024**" යටතේ දක්වා ඇති අනෙකුත් කරුණු නොවෙනස්ව එලෙස ම බලපැවැත් වේ.

තිලක් සෙනරත්,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

2024 නොවැම්බර් මස 28 වැනි දින,
බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 628, ජනජය සිටි ගොඩනැගිල්ල, 10 වන මහල,
නාවල පාර, රාජගිරිය.

### උපලේඛනය 02

| *අනු. අංකය* | *විෂයය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|
| 1 | ප්‍රාථමික | අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ මව් භාෂාව ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 2 | ඉංග්‍රීසි භාෂාව | අදාළ විෂය අ.පො.ස. (උසස් පෙළ) විෂයක් ලෙස / විෂය ධාරාව ලෙස සමත් වී තිබීම හෝ උසස් පෙළ සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සම්මාන සාමාර්ථ්‍යයක් හෝ ඊට ඉහළ සාමාර්ථ්‍යයක් සහිතව සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 3 | නැටුම් (දේශීය) | අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේ දී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 4 | සංගීතය (පෙරදිග) | අධ්‍යාපනවේ දී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 5 | විද්‍යාව | අදාළ විෂය අ.පො.ස. (උසස් පෙළ) විෂයක් ලෙස /විෂය ධාරාව ලෙස හදාරා ඉන් සමත් වී තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |

| *අනු. අංකය* | *විෂයය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|
| 6 | ගණිතය | අදාළ විෂය අ.පො.ස. (උසස් පෙළ) විෂයක් ලෙස /විෂය ධාරාව ලෙස හදාරා ඉන් සමත් වී තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 7 | සිංහල භාෂාව හා සාහිත්‍යය | අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 8 | දෙමළ භාෂාව හා සාහිත්‍යය | අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 9 | ඉතිහාසය | අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 10 | බුද්ධ ධර්මය | අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස බුද්ධ ධර්මය හෝ බෞද්ධ ශිෂ්ටාචාරය විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 11 | හින්දු ධර්මය | අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස හින්දු ධර්මය හෝ හින්දු ශිෂ්ටාචාරය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 12 | ඉස්ලාම් ධර්මය | අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස ඉස්ලාම් ධර්මය හෝ ඉස්ලාම් ශිෂ්ටාචාරය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 13 | කතෝලික ධර්මය | අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 14 | ක්‍රිස්තියානි ධර්මය | අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 15 | භූගෝල විද්‍යාව | අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 16 | පුරවැසි අධ්‍යාපනය | අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස දේශපාලන විද්‍යාව හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 17 | ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය | අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 18 | ව්‍යවසායකත්ව අධ්‍යයනය | අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 19 | හින්දි | අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |

| අනු. අංකය | විෂයය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|
| 20 | අරාබි | අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 21 | චීන | අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 22 | ජර්මන් | අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 23 | ජපන් | අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 24 | ප්‍රංශ | අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 25 | කොරියන් | අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 26 | දෙවන බස සිංහල | අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 27 | දෙවන බස දෙමළ | අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 28 | සංගීතය (අපරදිග) | අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 29 | සංගීතය (කර්ණාටක) | අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 30 | චිත්‍ර | අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 31 | නැටුම් (භාරතීය) | අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 32 | නාට්‍ය හා රංග කලාව | අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 33 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |

| *අනු. අංකය* | *විෂයය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|
| 34 | කෘෂි හා ආහාර තාක්ෂණය | අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 35 | ශිල්ප කලා | අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සඳහා ශිල්ප කලා විෂයයට A සාමාර්ථයක් ලබා තිබීම සහ අධ්‍යාපනවේදී උපාධිය සම්පූර්ණ කර තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 36 | ගෘහ ආර්ථික විද්‍යාව | අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සඳහා ගෘහ ආර්ථික විද්‍යාව විෂයයට A සාමාර්ථයක් ලබා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 37 | සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | අ.පො.ස. (සා.පෙළ) සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය විෂයට A සාමාර්ථයක් ලබා තිබීම සමග, අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම හා ක්‍රීඩා ජයග්‍රහණ අවම වශයෙන් දිස්ත්‍රික් හෝ පළාත් මට්ටම ලබා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය සම්පූර්ණ කර තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 38 | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය | අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂයක් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 39 | විශේෂ අධ්‍යාපනය | අධ්‍යාපනවේදී උපාධිය තුළ විශේෂ අධ්‍යාපනය විෂයක් ලෙස හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 40 | ශිෂ්‍ය උපදේශනය | අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයක් වශයෙන් උපදේශනය / මනෝ විද්‍යාව හදාරා තිබීම හෝ අධ්‍යාපනවේදී උපාධිය සමඟ උපදේශනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සම්පූර්ණ කර තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |
| 41 | පුස්තකාල විද්‍යාව | අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ මව් භාෂාව ප්‍රධාන විෂය හෝ අනු විෂයක් හදාරා තිබීම හෝ අධ්‍යාපනවේදී උපාධිය සමඟ පුස්තකාල විද්‍යාවට අදාළ එක් අවුරුද්දකට නොඅඩු ඩිප්ලෝමාවක් හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම |

***විශේෂ සටහන්*** -

1. පුස්තකාල විද්‍යාව, ශිෂ්‍ය උපදේශනය, විශේෂ අධ්‍යාපනය, ශිල්ප කලා, ගෘහ ආර්ථික විද්‍යාව, සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය හැර අනෙකුත් විෂයන් සඳහා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂය සලකා බැලීමේදී අධ්‍යාපනවේදී උපාධියට අදාළ පොදු විෂයන් හැර ඉතිරි විෂයන්ගෙන් අවම වශයෙන් 1/3ක් ඉල්ලුම් කරන විෂයට අදාළ විය යුතුය.

2. ඉංග්‍රීසි, විද්‍යාව, ගණිතය විෂයන් හැර අනෙකුත් විෂයන් සඳහා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂය හෝ අනු විෂය ලෙස අවම වශයෙන් 1/3 ආවරණය නොවන අවස්ථාවලදී, අදාළ විෂය අධ්‍යාපනවේදී උපාධිය තුළ විෂයක් ලෙස හදාරා තිබිය යුතු අතර, අදාළ විෂය අ.පො.ස. . උසස් පෙළ විෂයක් ලෙස / විෂය ධාරාව ලෙස හදාරා සම්මාන සාමාර්ථ්‍යයක් හෝ ඉහළ සාමාර්ථ්‍යයක් සහිතව සමත් වී තිබිය යුතුය.

11-384

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.